## 224 සමරිතානු ළඳ

සමරිතානු ළඳ පිළිබඳ මියුරු කතාවේ
පුවත අසත රුව දිස්වේ ජේසුතුමාගේ
පිපාසයට පැන් ඉල්ලා සිටිය වතාවේ
කෙරුණු කතා බහද ඇසේ සවන් පිනායේ

මෙහෙව් වතුර බොන හැම දෙන යළි පිපාස වේ
මා දෙන දිය බොන අය හට පවස ඇති නොවේ
ඉඳුරා පවසම් ඔබහට සදා ජීවනේ
ලබනු පිණිසැ ඔබ තුළ දිය උල්පතක් මැවේ

කිසිදා ඇති නොවන පිණිසැ ම හට පිපාසේ
ගැහැටක් ඇති නොවනට දුර ගමනෙ විඩාවේ
දෙනු මැන හිමියනි දෙනු මැන ඔබ කී ලෙස ඒ
සදා පවස සංසිඳුවන ජලය ජීවනේ

හෙළිවුණු විටැ සමිඳු මුවින් එළඳගේ තතු
එතුමා දිවැසියකු බව මැ සැබව ඕ සිතු
රට පුරා මැ දිවැ ගිය ඈ ජන රැස් ඇමතු
ඇය කළ හැම දේ එතුමන් කී බව පැවැසූ